ශ සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන්ගෙන් තොරතුරු ඉල්ලා සිටීම.

ශ සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන්ට විධාන නිකුත් කිරීම.

## විවිධ වැරදි සහ විත්තිවාචික

### වංචාව

වංචාව යනු යම් පුද්ගලයෙකුව රවටමින් තවත් අයෙකු විසින් වාසියක් අත්කර ගැනිම හෝ තමාගේම කර්තව්‍යක් සිදුකර ගැනීමයි. ( දණ්ඩ නීති සංග්‍රහයේ 398 වගන්තිය )

විත්තිවාචික -
- ☛ සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැති වීම.
- ☛ වංචා කිරීමේ චේතනාවක් නොමැති විම.
- ☛ මුලාවීම
- ☛ වංචාකාරී නොවන ප්‍රකාශ

### සොරකම

සොරකම යනු යම් චංචල දේපලක් යම් තැනැත්තෙකුගේ ස්වාමිකත්වයෙන් එකී තැනැත්තාගේ කැමැත්ත නොමැතිව වංක ලෙස ගැනීමේ අදහසින් එබඳු ගැනීමක් සඳහා ඉවත් කිරීමයි. ( දණ්ඩ නීති සංග්‍රහයේ 366 වගන්තිය )

විත්තිවාචික -
- ☛ දේපල අයිතියට හිමිකම් පෑම
- ☛ මත්වීම
- ☛ මුළාවීම
- ☛ දේපළ ආපසු ලබාදීමේ චේතනාව

### නොසැලකිල්ල ( නොසලකාහැරීම )

සාධාරණ බුද්ධිමත් පුද්ගලයෙකු විසින් නොකරනු ලබන ක්‍රියාවක් කිරීම හෝ සාධාරණ බුද්ධිමත් පුද්ගලයෙකු විසින් කරනු ලබන ක්‍රියාවක් නොකිරීම.

විත්තිවාචික -
- ☛ සහායක නොසැලකිල්ල
- ☛ අවදානම ස්වේච්චාවෙන් භාර ගැනීම
- ☛ නොවැලැක්විය‌හැකි අනතුර
- ☛ අනීතික ක්‍රියාව

**පීටිස් එ. හන්ට්** - යතුරුපැදියක පසුපස අසුනේ ගමන් ගත් බීමත් පැදිකරුවෙකු, එය පැදවූ තැනැත්තා බීමතින් සිටි බව දැනදැනම ඉතා වේගයෙන් සහ නොසැලකිල්ලෙන් යතුරු පැදිය පැදවීම සඳහා එය පැදවූ අයව ධෛර්යමත් කළේය. පසුව එම රථය අනතුරතට භාජනය වී රියදුරු මියගිය අතර, පිටුපස අසුනේ ගමන් ගත් අය තුවාල ලැබිය. නොසැලකිලිමත්භාවය මත පිටුපස අසුනේ ගමන්ගත් අයට මෙහිදී වන්දි ලබාගැනීමට හැකියාවක් නොමැති බව අධිකරණය තීරණය කළේය.

අල්ලසක් යනු 1965 අංක 02 දරණ අල්ලස් පනතේ විධිවිධාන උල්ලංගනය කරමින් යම් තුටු පඬුරක් ඉල්ලා සිටීම, ලබා ගැනීම හෝ දීමයි.